# ගබ්සාව සම්බන්ධ බෞද්ධ ආකල්පය පිළිබඳ ආචාරවිද්‍යාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය, කුඹුගොඩ ආරේ පඤ්ඤාලෝක හිමි[1], පූජ්‍ය, ගෝනලගොඩ නන්ද හිමි[2]

### හැඳින්වීම

වර්තමානයේ ඉතා බහුල ව සාකච්ඡාවට ලක් වී ඇති ප්‍රස්තුතයක් ලෙස 'ගබ්සාව' හඳුනා ගත හැකි ය. පෙරා'පර දෙදිග විවිධ චින්තකයන් මෙම ප්‍රස්තුතය සම්බන්ධයෙන් විග්‍රහ කොට ඇති නමුත් මෙහි ලා බෞද්ධ ආකල්පය පිළිබඳ පමණක් අවධානය යොමු කරනු ලැබේ. ආචාරවිද්‍යාත්මක ව ගත් කල හොඳ - නරක යන දෙයංශයෙන් ම මෙය විවරණය කළ හැකි නමුදු බුදුන් වහන්සේගේ දේශනය කුමක් ද යන්න විමසීම කාලෝචිත ය. එයට හේතු වනුයේ විකෘති සඞ්කල්පගත කිරීම තුළින් බුද්ධදේශනය විපරීත තත්ත්වයට පත්වීම ය.

### පර්යේෂණයේ අරමුණ

ගබ්සාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම බුද්ධදේශනාව ආශ්‍රයෙන් පර්යේෂණයට ලක් කිරීම මෙම පර්යේෂණයේ අපේක්ෂිත අරමුණ යි.

### පර්යේෂණ ක්‍රමවේදය

බුදුදහමට අනුව ගබ්සාව ආචාරවිද්‍යාත්මකව සාධාරණීකරණය කළ හැකි ද? යන ගැටලුව මූලික කරගත් මෙම පර්යේෂණය ගබ්සාව බෞද්ධ ඉගැන්වීම්වලට අනුව අනුමත කළ නො හැකි ය යන උපන්‍යාසය මත පිහිටා ගුණාත්මක විධික්‍රමය යටතේ පුස්තකාල පරිශීලනයෙන් සිදු කරනු ලැබේ.

### පර්යේෂණ සාකච්ඡාව

නූතන වෛද්‍යවිද්‍යාවට අනුව ස්වාභාවික ගබ්සාව හා සාපරාධී ගබ්සාව යනුවෙන් ගබ්සාවෙහි කොටස් දෙකක් දැකිය හැකි ය. මින් ස්වාභාවික ගබ්සාව යනුවෙන් අර්ථ ගැන්වෙනුයේ ප්‍රජනනයෙන් පසුව කලලය ගර්භාශය තුළ නො පිහිටීම යි. හිතාමතා බාහිර උපක්‍රම මඟින් දරුගැබ විනාශ කිරීම සාපරාධී ගබ්සාව වේ. කලලයක් යනුවෙන් හැඳින්වෙනුයේ කාන්තාවක් ගැබ්ගෙන පළමු සති අට දක්වා කාලය යි. එතැන් සිට දරුවා උපත ලබන තෙක් කාලය 'භ්‍රෑණය' ලෙස හැඳින්වේ. මෙම කලලය පිළිබඳ ව පාරාජිකපාළි අට්ඨකථාව දක්වනුයේ "ස්ත්‍රී පුරුෂ බීජ සමවායෙන් හටගත් ඉහළට නැඟුණ තෙල් බිංදුවක් පමණ ඇති අංශුවක් කලලය ලෙස දිස්වේ" යනුවෙනි. එහි දී තලතෙල් බිංදුවක් යම්සේ නො කැළඹී පවතී ද එපරිද්දෙන් සමාන වූ මාපිය බීජ සමවායෙන් හටගත් වස්තුව කලලය ලෙස දැක්විය හැකි බව සඳහන් ය. බෞද්ධ විග්‍රහයට අනුව දරුගැබක් හට ගැනීමට නම් මාපියන්ගේ එකතුවීම, මව ඍතුවීම හා ගන්ධබ්බයාගේ පැමිණීම යන කරුණු ත්‍රිත්වය පූරණය විය යුතු බව මහා තණ්හාසඞ්ඛය සූත්‍රයේ දැක්වේ. එලෙස මනා සුසංයෝගයෙන් පසු ගැබ් ගන්නා කාන්තාවගේ ගැබ විනාශ කිරීම ගබ්සාව වන අතර, විනාශ කිරීමට උපකාර කිරීම ද පාපයක් බව විනයපිටකානුගත තොරතුරුවලින් පැහැදිලි වේ.

---

[1]. සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. *kumbugoda@gmail.com*
[2]. සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. *gonalagodananda@gmail.com*

පාරාජිකපාළියෙහි ගබ්සාව සම්බන්ධ සිද්ධීන් අටක් පමණ දැකිය හැකි අතර, එහි ස්වභාවය අනුව ගබ්සාව සඳහා ප්‍රතිකාර කිරීම පමණක් නො ව වඳභාවය නැති කිරීමට ද ප්‍රතිකාර සිදු කොට ඇත. ඊට අමතරව වඳභාවය ඇතිවීම පිණිස එනම්, දරුවන් බිහි නො කිරීමට ද භික්ෂූන්ගෙන් උපදෙස් ලබාගෙන ඇති බව හෙළි වේ. ඇතැම් අවස්ථාවන්හි දී ගබ්සාවන් සඳහා ලබා දෙන ලද ඖෂධවලින් දරුවා මෙන් ම මව ද මියගිය බව විනයපිටකයේ සඳහන් වේ. ගැබ් හෙළීම සම්බන්ධයෙන් විවිධ ප්‍රතිකාර සිදු කොට ඇති අතර, විනයපිටකයේ නිතර දැකිය හැකි 'ගබ්භපාතකං' යන පදය තුළ ද ඇත්තේ ඖෂධමය ප්‍රතිකාරයක් බව සාරත්ථදීපනීටීකාවේ සඳහන් වේ. මීට අමතර ව ගැබ් නැති කිරීම පිණිස සිදු කරන ලද උපක්‍රම වශයෙන් තදින් පිරිමැදීම, උදරය තැවීම ආදිය සිදු කොට ඇත. මෙවන් පසුබිමක් තුළ බුදුන් වහන්සේ මෙම සියලු ක්‍රියාකාරකම් ප්‍රතික්ෂේප කොට එවැන්නක් සිදු කළ හොත් පාරාජිකා ආදී ආපත්තීන්ට ද පත්වන බව දේශනා කළහ.

වර්තමානයෙහි ඇතැම් ආචාරවිද්‍යා න්‍යායාචාර්යයන් ගබ්සාව නීති විරෝධී ක්‍රියාවක් නො වන බවට කරුණු දක්වන අයුරු දැකිය හැකි ය. එහෙත් බුද්ධදේශනාවට අනුව ගබ්සාව හිතාමතා සිදු කරන දිවි තොර කිරීමකි. බෞද්ධ ඉගැන්වීමට අනුව ප්‍රාණඝාතය ආකාරත්‍රයකින් සිදු කළ හැකි ය. තමන් විසින් මැරීම, අනුන් ලවා මැරවීම, මැරීම අනුමත කිරීම යන ආකාරත්‍රය අනුව ද ගබ්සාව ප්‍රාණඝාතයකි. මීට අමතර ව ප්‍රාණඝාතයක් වීමට නම් ප්‍රාණියෙකු බව දැන ගත යුතු ය; ප්‍රාණියෙකු විය යුතු ය; මැරීමට උපක්‍රම යෙදිය යුතු ය; එය ක්‍රියාත්මක කළ යුතු ය; එය සාර්ථක විය යුතු ය; යන කරුණු සම්පූර්ණ විය යුතු ය.

එම කරුණු අතරත පස්වන කරුණ වන 'එය සාර්ථක විය යුතු ය' යන්න ගත් කල එය යම් හෙයකින් අසාර්ථක වුව ද පාපයක් සිදු වේ. ඉන් කර්මයෙහි ප්‍රබල බවෙහි ක්ෂයවීමක් විනා අකුසලයක් ඇති නො වේ යන්න කිව නො හැකි ය. ඊට හේතුව වනුයේ ගබ්සා කිරීමට යත්න කිරීම ද චේතනාවක් බැවිනි. එහෙත් වර්තමානයෙහි බාල වයස්කාර දැරියන් ගැබ්බර වුවහොත් ගබ්සා කිරීම නීත්‍යානුකූල ව සිදු කෙරේ. එහි දී බාල වයස්කාරියගේ අධ්‍යාපනය, දරුවෙකු බිහි කිරීමට තරම් කායශක්තියක් නොමැතිකම ආදී කරුණු සලකා බලා එවැනි ක්‍රියා සිදු කරනු ලැබේ. නමුත් **"චෙතනා'හං භික්ඛවෙ කම්මං වදාමි"** යන බුද්ධදේශනයට අනුව සිතීම කර්මයක් වේ. එයට වයස් භේදයක් දැකිය නොහැකි ය. එසේ ම **"යෙ කෙචි පාණභූතත්ථි තසා වා ථාවරා වා අනවසෙසා...."** යන කරණීයමෙත්ත සූත්‍රානුගත අදහසට අනුව ඉපදුණු සත්ත්වයාට මෙන් ම නූපන් සත්ත්වයාට ද මෛත්‍රීය කළ යුතු ය. තව ද "සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා" යන අනුශාසනය ගත්ත ද එමඟින් ද මෛත්‍රීය වැඩීම අදහස් කෙරේ. මේ අනුව ගබ්සාව සම්බන්ධ බෞද්ධ ආකල්පය ආචාරවිද්‍යාත්මක ව කෙතරම් දුරට සාධාරණය කළ හැකි ද යන්න අවබෝධ කළ හැකි ය. ආචාරවිද්‍යා න්‍යායාචාර්යන් ගබ්සාව සාධාරණීකරණය කළ ද බුදුදහමට අනුව එය සිදු කළ නො හැක්කකි. එසේ සිදු කරන්නේ නම් එය බුදුදහම අනුමත නො කරන්නකි.

**පර්යේෂණ නිගමනය**

වර්තමානයෙහි බහුලව දැකිය හැකි ගබ්සාව සම්බන්ධ බෞද්ධ ආකල්පය මෙහි දී අධ්‍යයනයට ලක් කරන ලදී. ඇතැම් මානවවාදී හා ස්ත්‍රීවාදී න්‍යායාචාර්යවරුන් ගබ්සාව සාධාරණීකරණය කළ ද එය බුදුදහමට

අනුව සිදු කළ නො හැක්කකි. බුදුදහම පරම අවිහිංසාවාදී දහමක් බැවින් එක් අයෙකුගේ යහපත පිණිස තව කෙනෙකුට හිංසා අනුමත කළ නො හැකි ය. බුදුන් වහන්සේ තමාටත් අන් අයටත් යන දෙපක්ෂයට ම යහපත් වන ක්‍රියා පමණක් අනුමත කළහ. එබැවින් ගැබ් ගත් කාන්තාවගේ යහපත පිණිස උපත ලබන ලබන්නට සිටින ජීවියෙකුට හිංසා කරන්නේ නම් එය අකුසලයකි. ඒ අනුව බුදුදහමට අනුව ගබ්සාව ආචාරවිරෝධී ක්‍රියාවක් ලෙස පෙන්වා දිය හැකි ය. පටිච්චසමුප්පාද ධර්මවිග්‍රහය අනුව වුව ද අප නැති කළ යුත්තේ යම් ප්‍රතිඵලයකට බලපාන හේතුව යි. එබැවින් විනාශ කළ යුත්තේ දරුගැබ නො ව දරුගැබක් විනාශ කිරීමට සමාජය යොමුවන හේතූන් ය.

**ප්‍රමුඛ පද:** ගබ්සාව, කලලය, බෞද්ධ, ආචාරවිද්‍යාව, ප්‍රාණඝාතය

**මූලාශ්‍රය**


- ආරියරත්න, රොකී (1998). **කාන්තාව හා නීතිය.** කොළඹ: සී.ස. ස්ටැම්ෆර්ඩ්ලේක් පුද්ගලික සමාගම.
- පේමසිරි, පී.ඩී. (2000). **බෞද්ධ ආචාරධර්ම.** මහරගම: තරංජි ප්‍රින්ටර්ස්.
- **පාරාජිකපාළි අට්ඨකථා.** (බු.ව. 2494). හේවාවිතාරණ මුද්‍රණය. කොළඹ: ත්‍රිපිටක මුද්‍රණාලය.
- **බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා.** (බු.ව. 2549). නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- විජයන්ති, ඉන්දිරා එච්.ඩී. (2004). **ගබ්සාව.** කොළඹ: විජයන්ති ප්‍රකාශන.